මාධ්‍ය නිවේදන අංක. 16

## පාර්ලිමේන්තු මහ මැතිවරණය 2010.04.08

## නාම යෝජනා භාරගැනීම

2010 පෙබරවාරි මස 09 වැනි දිනැති අංක. 1640/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් කරන ලද ප්‍රකාශනය පරිදි 2010.04.08 වැනි දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණය සඳහා 2010.02.19 වැනි දින සිට 2010.02.26 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා නාමයෝජනා භාර ගැනීම ඒ ඒ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් සිදු කරන ලදි.

02. ඒ අනුව ඡන්ද විමසීම සඳහා මැතිවරණ දිස්ත්‍රික්ක 22 සඳහා පිළිගත් දේශපාලන පක්ෂ යටතේ නාමයෝජනා පත්‍ර 366 ක්ද, ස්වාධීන කණ්ඩායම යටතේ නාමයෝජනා පත්‍ර 370 ක්ද වශයෙන් නාමයෝජනා 736 ක් ලැබුණු අතර එයින් පිළිගත් පක්ෂ වලින් ඉදිරිපත් වූ නාමයෝජනා 30 ක් සහ ස්වාධීන කණ්ඩායම් යටතේ ඉදිරිපත් වූ නාමයෝජනා 69 ක් පාර්ලිමේන්තු මැතිවරණ පනතේ නියමයන්ට අනුකූලව ඉදිරිපත් නොවූ බැවින් , අදාල තේරීම් භාර නිලධාරීන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත.

03. පිළිගනු ලැබූ මුලු නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව 637 ක් වන අතර එයින් 336 ක් පිළිගත් දේශපාලන පක්ෂ 36 කින්ද, 301 ක් වෙන වෙනම ස්වාධීන කණ්ඩායම් වශයෙන්ද ඉදිරිපත් කරන ලදී. මෙ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රී ධූර 196ක් සඳහා තරඟ කරනු ලබන මුළු අපේක්ෂක සංඛ්‍යාව 7620 කි.

04. එක් එක් දිස්ත්‍රික්කය යටතේ තරඟ කරනු ලබන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව සහ අපේක්ෂක සංඛ්‍යාව දැක්වෙන ලේඛනයක් යා කර ඇත.

**දයානන්ද දිසානායක**
**මැතිවරණ කොමසාරිස්**

**මැතිවරණ මහ ලේකම් කාර්යාලය**
**සරණ මාවත**
**රාජගිරිය.**

**2010.02.27**